# සමාගම් ගිණුම්කරණය
# II කොටස

# සාමාන්‍ය කොටස් නැවත මිලදී ගැනීම

සමාගමක් විවිධ හේතුන් පාදක කරගනිමින් දැනට නිකුත් කොට ඇති කොටස්, නැවත මිලදී ගැනීමට හෙවත් සාමාන්‍ය කොටස් හිමියා සම්බන්ධයෙන් සමාගමට ඇති වගකීම අඩු කිරීමට උනන්දු වෙයි. මෙය සාමාන්‍ය කොටස් හිමියාට තමන්ගේ ආයෝජනය ඉවත් කරගැනීම සඳහා ඇති අවස්ථාවක් ලෙසද සැලකිය හැක.

සමාගමකට සාමාන්‍ය කොටස් නැවත මිලදී ගැනීම පහත පරිදි කළ හැක.

- පෞද්ගලික සමාගමක සියලුම කොටස් හිමියන්ගේ එකඟතාවය මත නැවත මිලදී ගැනීම.
- සමාගමක සාංගමික ව්‍යවස්ථාවලිය පරිදි කොටස් නැවත මිලදී ගැනීමට අධ්‍යක්ෂක මණ්ඩලයට අනුමැතිය ඇති විට, අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිතව
- අධිකරණ නියෝගයක් මත කොටස් නැවත මිලදී ගැනීම

සමාගමක් විසින් නැවත මිලදී ගන්නා කොටස් මිලදී ගත් වහාම, ඒවා අවලංගු කොටස් බවට පත්වේ. මේවා **අවලංගු කොටස්** යනුවෙන් ඒ අනුව හැඳින්වෙයි.

සමාගමක් අවස්ථානුකූලව සාමාන්‍ය කොටස් නිකුත් කළ මිලටම හෝ ඊට වඩා වැඩි මිලකට (අධි අගයක්) කොටස් නැවත මිලදී ගත හැක.

උදාහරණ -

- රුපියල් 10ක නිකුතු මිලකට නිකුත් කර ඇති කොටස් නැවත රුපියල් 10 මිලටම මිලදී ගැනීම
- රුපියල් 10කට නිකුත්කර ඇති කොටස් රුපියල් 15 (අධි අගයකට) බැගින් නැවත මිලදී ගැනීම් මිලට ගැනීම

## කොටස් නැවත මිලදී ගැනීම සඳහා ගිණුම්කරණය

### නිකුත් කළ මිලට සමාන අගයකට නැවත මිලට ගැනීම

මෙහිදී සමාගම කොටස් මුල් අවස්ථාවේ දී නිකුත් කළ මිලටම කොටස් හිමියන්ගෙන් නැවත කොටස් මිලදී ගැනීම සිදු කරයි. ඒ අනුව, එය ගිණුම් තැබීම සඳහා පහත ද්විත්ව සටහන් යොදාගැනේ.

නැවත මිලදී ගනු ලබන කොටස්වල නිකුතු මිල

..........................................................................................................................................

..........................................................................................................................................

නැවත මිලදී ගනු ලබන සාමාන්‍ය කොටස් වලට මුදල් ගෙවීම

..........................................................................................................................................

..........................................................................................................................................

## අභ්‍යාසය 123

සීමාසහිත අනුජ පොදු සමාගම එකක් රුපියල් 10 බැගින් සාමාන්‍ය කොටස් 100,000ක් නිකුත් කර ඇත. සමාගම විසින් ඉන් කොටස් 40,000ක් රුපියල් 10 බැගින් නැවත මිලදී ගැනීමට තීරණය කර ඒ පිළිබඳව කොටස් හිමියන්ට දැනුවත් කළ නමුත් ඒත් සඳහා 30,000ක කොටස් හිමි, කොටස් හිමියන් පමණක් එකඟ වී ඇත. ඒ අනුව එකක් රුපියල් 10 බැගින් කොටස් 30,000ක් සමාගම විසින් නැවත මිලට ගන්නා ලදී.

අවශ්‍ය ජර්නල් සටහන් සහ ලෙජර ගිණුම් පෙන්වන්න.

**නිකුත් කළ මිලට වඩා වැඩි අගයකට (අධි මිලකට) නැවත කොටස් මිලට ගැනීම**

නැවත මිලදී ගන්නා සාමාන්‍ය කොටස් වල නිකුතු මිල

.......................................................................................................................

.......................................................................................................................

නැවත මිලදී ගන්නා සාමාන්‍ය කොටස් වල අධි අගයන්

.......................................................................................................................

.......................................................................................................................

නැවත මිලදී ගන්නා කොටස්වලට මුදල් ගෙවීම

.......................................................................................................................

.......................................................................................................................

## අභ්‍යාසය 124

සීමිත තක්ෂිලා පොදු සමාගම එකක් රුපියල් 10 බැගින් කොටස් 1000,000ක් නිකුත් කර ඇත. සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙන් පහත තොරතුරු උපුටා ගෙන ඇත.

| | |
|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (රුපියල් 10 බැගින් කොටස්) .......................................... | 10,000,000 |
| ප්‍රත්‍යාගණන සංචිත ........................................................................................ | 4,000,000 |
| පොදු සංචිත ....................................................................................................... | 5000,000 |
| රඳවාගත් ඉපයුම් ............................................................................................... | 1000,000 |
| මුළු හිමිකම ...................................................................................................... | 20,000,000 |

සමාගම විසින් එකක් රුපියල් 15 බැගින් කොටස් 400,000ක් නැවත මිලදී ගැනීමට තීරණය කර ඒ පිළිබඳව කොටස් හිමියන් දැනුවත් කිරීමෙන් අනතුරුව, කොටස් හිමියන් ඒ සඳහා එකඟ වී ඇත. ඒ අනුව අදාළ කොටස් නැවත මිලට ගැනීම මුළුමනින්ම සම්පූර්ණ කරන ලදී.

- ඉහත ගනුදෙනුව සටහන් කිරීමට අවශ්‍ය ජ'නල් සටහන් හා ලෙජර ගිණුම් පිළියෙල කරන්න.
- ඉහත ගනුදෙනුවෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උද්ධෘතයන් පෙන්වන්න.

## ණයකර

සමාගමක් විසින් බාහිර පාර්ශ්වයකින් යම් ණය මුදලක් ලබාගත් බවත් එම ණය මුදල හා ඊට අදාළ පොලිය එකඟ වූ ආකාරයට ආපසු ගෙවන බවත් සහතික කරමින් නිකුත් කරන සමාගමේ නිල මුද්‍රාව සහිත ලියවිල්ලකි.

ණයකර සමාගමකට බාහිර වශයෙන් අරමුදල් සපයා ගැනීමට ඇති ප්‍රධානතම ක්‍රමය වේ.

### සාමාන්‍ය කොටස් හා ණයකර අතර වූ වෙනස්කම්

| සාමාන්‍ය කොටස් | ණයකර |
|---|---|
| 1. කොටස් මිල දී ගත් අය කොටස්හිමියන් වන අතර ඔවුන් සමාගමේ හිමිකරුවන් ය. | 1. ණයකර මිල දී ගත් අය ණයකරහිමියන් වන අතර ඔවුන් සමාගමේ ණයහිමියන් කොටසක් වේ. |
| 2. කොටස්හිමියන්ට සමාගම කළමනාකරණය කළ හැකිය. | 2. ණයකරහිමියන්ට සමාගම කළමනාකරණය කළ නොහැකිය. |
| 3. කොටස්හිමියන්ට ඡන්ද බලය ඇත. | 3. ණයකරහිමියන්ට ඡන්ද බලය හිමි නොවේ. |
| 4. කොටස් සඳහා ලාභාංශ ලැබේ. | 4. ණයකර සඳහා පොලී ලැබේ. |
| 5. ලාභාංශ ගෙවනුයේ ලාභ ඇත්නම් පමණි. | 5. ලාභ ඇතත් නැතත් ණයකර සඳහා පොලී ගෙවිය යුතුය. |
| 6. කොටස් නිකුත් කිරීමේ දී වත්කම් ඇපයට නොතබයි. | 6. ණයකර නිකුත් කිරීමේ දී බොහෝ විට සමාගමේ වත්කම් ඇපයට තබයි. |

### ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම

ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම කොටස් නිකුත් කිරීම හා නිදහස් කිරීමට සාපේක්ෂවව තරමක් සංකීර්ණ වේ. ණයකර නිකුත් කිරීමේදී හා නිදහස් කිරීමේදී සමාගමට ප්‍රධාන වශයෙන් මිල වර්ග තුනක් යොදාගගත හැක.

ඒවා නම්,

- සමක මිල හෙවත් සම මිල
- අධිමිල
- වට්ටම් මිල

### සමක මිළ හෙවත් සම මිල (Par Value)

ණයකර එකක සාමාන්‍ය වටිනාකම රුපියල් 100ක් වන අතර එය සම මිල ලෙස හැඳින්වේ. ණයකරයක් සම මිලට වඩා අඩුවෙන් හෝ වැඩියෙන් නිකුත් කළ හෝ නිදහස් කළ හැක.

### වට්ටම් මිල (Discount Value)

ණයකරයක් නිකුත් කිරීමේදී හෝ නිදහස් කිරීමේදී සම මිලට වඩා අඩු මිලකට එය නිදහස් කිරීම හෝ නිකුත් කිරීම සිදු කරයි නම්, එය වට්ටම් මිලක් ලෙස හැඳින්වේ.

**අධිමිල (Premium Value)**
ණයකරයක් නිකුත් කිරීමේදී හෝ නිදහස් කිරීමේදී සමක මිල හෙවත් සම මිලට වඩා වැඩියෙන් මිලකට නිකුත් කරයි නම්, එය අධි මිලක් ලෙස හැඳින්වෙයි.

සාමාන්‍යයෙන් ණයකරයක සම මිල රුපියල් 100ක්වේ. එබැවින් අධි මිල යනු රුපියල් 100ට වඩා වැඩි මිල ගණන්ය. අවම මිල යනු රුපියල් 100ට වඩා අඩු මිල ගණන් ය.

ණයකර නිකුත් කිරීමේදී සම මිලට, අධි මිලට හෝ වට්ටම් මිලට නිකුත් කළ හැක. එමෙන්ම, ණයකරයක් නිදහස් කිරීමේදී ද සම මිලට, අධි මිලට හෝ අව මිලට නිදහස් කිරීම සිදු කළ හැක.

## නිදසුන්

(1) සීමිත ලක්රුවන් සමාගම ණය ප්‍රාග්ධනය මගින් අරමුදල් රැස්කර ගැනීම සඳහා 10% ණයකර නිකුත් කිරීමට තීරණය කරන ලදී. ණයකරයක් රුපියල් 100 බැගින් නිකුත් කළ අතර ඒවා වර්ෂ පහකින් 3]ක අධි මිලකට නිදහස් කිරීමට අපේක්ෂා කෙරේ. ණයකර 50,000ක් සමාගම විසින් නිකුත් කරන ලදී .

ණයකර නිකුත් කළ මිල
ණයකර නිදහස් කරන මිල
ණයකර නිදහස් කරන දිනය
ණයකර සඳහා වාර්ෂික පොලිය
ණයකර නිකුත් කිරීමෙන් ලද මුදල
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවිය යුතු මුදල

(2) සීමිත ජනජය සමාගම ණය ප්‍රාග්ධනය මගින් අරමුදල් රැස්කර ගැනීම සඳහා 10% ණයකර නිකුත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව සමාගම එකක් රුපියල් 100 බැගින් වන ණයකර 5% ක අධි මිලකට නිකුත් කළ අතර ඒවා වර්ෂ 5 කින් ගෙවා නිදහස් කිරීමට අපේක්ෂා කෙරේ. ණයකර නිදහස් කිරීමේදී 3%ක වට්ටම් මිලකට නිදහස් කරන බව ණයකර ඔප්පුවේ සඳහන් වේ. සමාගම විසින් ණයකර 100,000ක් නිකුත්කරන ලදී.

ණයකර නිකුත් කළ මිල
ණයකර නිදහස් කරන මිල
ණයකර නිදහස් කරන දිනය
ණයකර සඳහා වාර්ෂික පොලිය
ණයකර නිකුත් කිරීමෙන් ලද මුදල
ණයකර නිදහස් කිරීම සඳහා ගෙවිය යුතු මුදල

මේ අනුව බලන විට ණයකර නිකුත් කිරීම හා නිදහස් කිරීම සම්බන්ධයෙන් ඉහත මිල ගනන් මිශ්‍රණයක් විය හැකි අවස්ථා පැවතිය හැකි බව අවබෝධ කරගත යුතුය.

උදාහරණ ලෙස,

අධි මිළට නිකුත් කළ ණයකරයක් වට්ටම් මිලකට නිදහස් කළ හැක.
සම මිලට නිකුත් කළ ණයකරයක් අධි මිලකට නිදහස් කළ හැක.
වට්ටම් මිලකට නිකුත් කළ ණයකරයක් සම මිලට නිදහස් කළ හැක.

ඉහත මිල මිශ්‍රණයන්ගෙන් පැවතිය හැකි අවස්ථා 9ක්, ඒ අනුව හඳුනාගත හැකිය.

| | ණයකර නිකුත් කළ මිල | ණයකර නිදහස් කරන මිල |
|---|---|---|
| 1 | සම මිල | සම මිල |
| 2 | සම මිල | අධි මිල |
| 3 | සම මිල | වට්ටම් මිල |
| 4 | අධි මිල | සම මිල |
| 5 | අධි මිල | අධි මිල |
| 6 | අධි මිල | වට්ටම් මිල |
| 7 | වට්ටම් මිල | සම මිල |
| 8 | වට්ටම් මිල | අධි මිල |
| 9 | වට්ටම් මිල | වට්ටම් මිල |

## ණයකර නිකුත් කිරීම සහ ණයකර නිදහස් කිරීම සඳහා ගිණුම්කරණය

ඉහත වගුවේ දැක්වූ අවස්ථා 9 සඳහා ගිණුම් තැබීම පහත පරිදි වේ.

***මෙහිදී 12% ණයකරයක මිල රුපියල් 100ක් ලෙසත්, වට්ටම් ලබා දෙන අවස්ථා වල දී 5%ක වට්ටමක් ද, අධි මිළට නිකුත් කරන අවස්ථා හෝ නිදහස් කරන අවස්ථාවල දී 3%ක අධි මිලක් පවත්වා ගනු ලබන බවත් උපකල්පනය කර ඇත.***

<table>
<tr><th></th><th>ණයකර නිකුත් කිරීමේදී</th><th>ණයකර නිදහස් කිරීමේදී</th></tr>
<tr><td rowspan="2">අවස්ථා අංක 1</td><td colspan="2">සම මිලට ණයකර නිකුත් කිරීම හා සම මිලට නිදහස් කිරීම</td></tr>
<tr><td>මුදල් / බැංකු ගිණුම හර 100<br>12% ණයකර ගිණුම බැර 100</td><td>12% ණයකර ගිණුම හර 100<br>මුදල් / බැංකු ගිණුම බැර 100</td></tr>
<tr><td rowspan="2">අවස්ථා අංක 2</td><td colspan="2">සම මිලට ණයකර නිකුත් කිරීම හා අධි මිලට නිදහස් කිරීම</td></tr>
<tr><td>මුදල් / බැංකු ගිණුම හර 100<br>12% ණයකර ගිණුම බැර 100<br><br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 3<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම බැර 3</td><td>12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම හර 3<br>මුදල් / බැංකු ගිණුම බැර 103</td></tr>
<tr><td rowspan="2">අවස්ථා අංක 3</td><td colspan="2">සම මිලට නිකුත් කළ ණයකරයක් වට්ටම් මිලකට නිදහස් කිරීම</td></tr>
<tr><td>මුදල් / බැංකු ගිණුම හර 100<br>12% ණයකර ගිණුම බැර 100</td><td>12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමට අදාළ ලාභ ගිණුම බැර 5<br>මුදල් / බැංකු ගිණුම බැර 95</td></tr>
<tr><td rowspan="2">අවස්ථා අංක 4</td><td colspan="2">අධි මිලට නිකුත් කළ ණයකරයක් සම මිලට නිදහස් කිරීම</td></tr>
<tr><td>මුදල් / බැංකු ගිණුම හර 103<br>12% ණයකර ගිණුම බැර 100<br>ණයකර අධි මිල ගිණුම බැර 3</td><td>12% ණයකර ගිණුම හර 100<br>මුදල් / බැංකු ගිණුම බැර 100</td></tr>
</table>

| | | |
|---|---|---|
| | **අධි මිලට ණයකර නිකුත් කිරීම හා අධි මිලට නිදහස් කිරීම** | |
| **අවස්ථා අංක 5** | මුදල් / බැංකු ගිණුම හර 103<br>12% ණයකර ගිණුම බැර 100<br>ණයකර අධි මිල ගිණුම බැර 3<br><br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 3<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම බැර 3 | 12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම හර 3<br>මුදල් / බැංකු ගිණුම බැර 103 |
| | **අධි මිලට නිකුත් කළ ණයකරයක් වට්ටම් මිලකට නිදහස් කිරීම** | |
| **අවස්ථා අංක 6** | මුදල් / බැංකු ගිණුම හර 103<br>12% ණයකර ගිණුම බැර 100<br>ණයකර අධි මිල ගිණුම බැර 3 | 12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමට අදාළ ලාභ ගිණුම බැර 5<br>මුදල් / බැංකු ගිණුම බැර 95 |
| | **වට්ටම් මිලට ණයකර නිකුත් කිරීම හා සම මිලට නිදහස් කිරීම** | |
| **අවස්ථා අංක 7** | මුදල් / බැංකු ගිණුම හර 95<br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 5<br>12% ණයකර ගිණුම බැර 100 | 12% ණයකර ගිණුම හර 100<br>මුදල් / බැංකු ගිණුම බැර 100 |
| | **වට්ටම් මිලට ණයකර නිකුත් කිරීම හා අධි මිලට නිදහස් කිරීම** | |
| **අවස්ථා අංක 8** | මුදල් / බැංකු ගිණුම හර 95<br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 5<br>12% ණයකර ගිණුම බැර 100<br><br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 3<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම බැර 3 | 12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමේදී වන අධිමිල ගිණුම හර 3<br>මුදල් / බැංකු ගිණුම බැර 103 |
| | **වට්ටම් මිලට නිකුත් කළ ණයකරයක් වට්ටම් මිලකට නිදහස් කිරීම** | |
| **අවස්ථා අංක 9** | මුදල් / බැංකු ගිණුම හර 95<br>ණයකර නිකුත් කිරීමේ අලාභ ගිණුම හර 5<br>12% ණයකර ගිණුම බැර 100 | 12% ණයකර ගිණුම හර 100<br>ණයකර නිදහස් කිරීමට අදාළ ලාභ ගිණුම බැර 5<br>මුදල් / බැංකු ගිණුම බැර 95 |

## අභ්‍යාසය 125

සීමිත තුෂාර පොදු සමාගම එකක් රුපියල් 100 බැගින් වූ ණයකර රුපියල් 10,000,000ක් නිකුත් කළ අතර ඒවා රුපියල් 100 බැගින්වූ මිලකට නිකුත් කරන ලදී. 12%ක පොලී අනුපාතයක් යටතේ නිකුත් කර ඇති මෙම ණයකර වසර 5 කින් කල් පිරෙන අතර වසර 5 කින් පසු 5%ක අධි මිලකට මෙම ණයකර නිදහස් කරනු ඇත.

ණයකර නිකුත් කිරීමේදී, නිදහස් කිරීමේදී හා පොලී ගෙවීමේදී අදාළ වන ද්විත්ව සටහන් ලියන්න.

## අභ්‍යාසය 126

සීමිත අනුෂ්ක පොදු සමාගම රුපියල් 100 බැගින් වූ ණයකර 50,000ක් නිකුත් කළ අතර ඒවා 5%ක වට්ටමකට යටත්ව නිකුත් කර ඇත. 10%ක පොලී අනුපාතයක් යටතේ නිකුත් කර ඇති මෙම ණයකර වසර 10 කින් කල්පිරෙන අතර වසර 10කට පසු 8% ක වට්ටමකට යටත්ව නිදහස් කරනු ඇත.
ණයකර නිකුත් කිරීමේදී, නිදහස් කිරීමේදී හා පොලී ගෙවීමේදී අදාළ වන ද්විත්ව සටහන් ලියන්න.

## අභ්‍යාසය 127

සීමිත නිහාල් පොදු සමාගම රුපියල් 100 බැගින් වූ ණයකර 100,000ක් නිකුත් කළ අතර ඒවා 10%ක අධි මිලකට නිකුත් කරන ලදී. 15%ක පොළී අනුපාතයක් යටතේ නිකුත් කර ඇති මෙම ණයකර වසර 7 කින් කල් පිරෙන අතර වසර 7කට පසු 3%ක අධි මිලකට යටත්ව නිදහස් කරනු ඇත.

ණයකර නිකුත් කිරීමේදී, නිදහස් කිරීමේදී හා පොලී ගෙවීමේදී අදාළ වන ද්විත්ව සටහන් ලියන්න.

## අභ්‍යාසය 128

සීමිත විමලධර්ම පොදු සමාගම එකක් රුපියල් 100 බැගින් වූ වසර 5 කින් ගෙවා නිදහස් කළ හැකි 12% බැගින් වාර්ෂිකව පොලී ප්‍රතිශතයක් ගෙවන ණයකර රුපියල් 2000,000ක් 15% ක අධි මිලකට නිකුත් කිරීමට තීරණය කරන ලදී. තවද ණයකර නිදහස් කිරීමේදී 5% ක වට්ටම් මිලකට යටත්ව නිදහස් කරන බව ණයකර ඔප්පුවේ සඳහන් වේ.

ණයකර නිකුත් කිරීමේදී, නිදහස් කිරීමේදී හා පොලී ගෙවීමේදී අදාළ වන ද්විත්ව සටහන් ලියන්න